ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

ශාස්ත්‍රවේදී උපාධි දෙවන වසර දෙවන අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019 ජන/පෙබ/මාර්තු

ආර්ථික විද්‍යාව

**ECON 2222.03 - ශ්‍රී ලංකාවේ ආර්ථිකය**

කාලය පැය තුනයි (03)

ඕනෑම ප්‍රශ්න **පහකට (05)** පමණක් පිළිතුරු සපයන්න.

01. (අ) ශ්‍රී ලංකාවේ වැඩවසම් සමාජ ව්‍යුහය බිඳ වැටීමට බලපෑ ප්‍රධාන සාධකය කෙටියෙන් පැහැදිලි කරන්න.

**(ලකුණු 04)**

(ආ) නිදහස ලබන විටත් ශ්‍රී ලංකා ආර්ථිකයේ දක්නට තිබූ ද්විත්ව ස්වරූපය සාකච්ඡා කරන්න.

**(ලකුණු 12)**

02. නිදහසින් පසු 1977 දක්වා ශ්‍රී ලංකා ආර්ථිකයේ සිදු වූ ප්‍රධාන ව්‍යුහාත්මක වෙනස්කම් සාකච්ඡා කරන්න.

**(ලකුණු 16)**

03. (අ) ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය මැනීම සඳහා භාවිතා වන මිණුම් දඬු මොනවාද?

**(ලකුණු 06)**

(ආ) නිදහසින් පසු ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය පිටුදැකීම සඳහා යොදාගත් වැදගත් උපායමාර්ග පැහැදිලි කරන්න.

**(ලකුණු 10)**

04. (අ) නිදහසට පෙර සිට වර්තමානය දක්වා ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධනයේ කැපී පෙනෙන ලක්ෂණ මොනවාද?

**(ලකුණු 12)**

(ආ) ශ්‍රී ලංකාවේ ජනගහනය වයස්ගතවීම නිසා පැන නඟින ගැටළු මගහරවා ගැනීමට ඔබට කළ හැකි යෝජනා මොනවාද?

**(ලකුණු 04)**

05. (අ) නිදහසින් පසු ශ්‍රී ලංකාවේ විදේශ ආයෝජන ගලා ඒම සහ එහි ප්‍රවනතා සාකච්ඡා කරන්න.

**(ලකුණු 10)**

(ආ) විදේශ ආයෝජන තුළින් ශ්‍රී ලංකාවට අපේක්ෂා කළ හැකි වාසි මොනවාද?

(ලකුණු 0

06. (අ) ශ්‍රී ලංකාවේ මෑතකාලීන අත්දැකීම් අනුව ආර්ථික සංවර්ධනය සඳහා පාලන නීති රීති වලින් තොර වෙළෙඳපොළ උපායමාර්ගයක් අනුගමනය කිරීමේ ඇති වාසි මොනවාද?

(ලකුණු 06)

(ආ) 1977 න් පසු ශ්‍රී ලංකාව අනුගමනය කළ අපනයන ප්‍රමුඛ කාර්මිකරණය තුළින් අපේක්ෂා කළ ඉලක්ක කොතෙක් දුරට ලගා කරගත හැකි විනිදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

07. (අ) ශ්‍රී ලංකාවේ ආර්ථිකය පිළිබඳව ද්විතියක දත්ත ලබා ගැනීම සඳහා සුදුසු මූලාශ්‍ර **හයක් (06)** දක්වන්න.

(ලකුණු 04)

(ආ) පසුගිය දශක දෙකක පමණ ශ්‍රී ලංකාවේ අපනයන අංශයේ හෝ ආනයන අංශයේ ප්‍රවනතා පිළිබඳ වාර්තාවක් සකස් කිරීම සඳහා ඔබට ආරාධනාවක් ලැබී ඇතැයි සිතන්න.

ඔබ තෝරාගත් මාතෘකාව තුළ අඩංගු විය යුතු ප්‍රධාන මාතෘකා උප මාතෘකා සහ ඒ ඒ මාතෘකා යටතේ ඇතුලත් විය යුතු කරුණු පිළිබඳව කටු සටහනක් පිළියෙල කරන්න.

(ලකුණු 12)

************